1961 අංක 27 දරන චක්‍ර ලේඛය

මගේ අංකය : ජීඑස්ජී 192.

1961 නොවැම්බර් මස 20 වැනි දින,

කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ

පිටපත්.—සියලුම සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයන්, දිස්ත්‍රික්ක පරීක්ෂකවරයන් සහ මාණ්ඩලික පරීක්ෂකවරයන් වෙතය.

සියලුම පාසල් ප්‍රධානීන් වෙත.

# ආදි ශිෂ්‍ය සංගමය

බොහෝ පාසල්වල පිහිටුවා ඇති ආදි ශිෂ්‍ය සංගම්වලින් සිදුවී ඇති මෙහෙය මැ
දෙපාර්තමේන්තුව දනී. එබඳු සංගම් සැම පාසල්වලම පිහිටුවීමද, පාසල් හා ආදි
අතර ඇති සම්බන්ධතාවය වඩාත් තහවුරු කරගැනීමද පරමාර්ථ කොට ගෙන පිළියෙල
දක්වෙන ව්‍යවස්ථා මාලාව අනුව වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදවන ලෙස ඔබට
ආරාධනා කෙරේ.

## ව්‍යවස්ථා මාලාව

1. නම.—මෙම සංගමය ආදි ශිෂ්‍ය සංගමය නමින් හඳුන්වනු ලැබේ.

2. සංගමය පිහිටුවීමේ හේතුන් සහ පරමාර්ථ.—පාසලේ පොදු දියුණුව උදෙසා
යන්ගේ සහයෝගය ඇතිව කටයුතු කිරීම.

ඒ කටයුතු නම්—

(ඒ) ශිෂ්‍යයන්ගේ පැවැත්ම වැඩිදියුණු කිරීම.

(බී) අවශ්‍යතන්හි අතිරේක පාසල් ඉඩකඩ ඇති කිරීමට හා උපකරණ සැපයීමට අ

(සී) විෂය මාලා විවිධ බවට පත්කිරීමට සහ වෘත්තීය මාර්ගොපදේශ ක්‍රමයට ආධ

(ඩී) දිවා ආහාරය සැපයීම සාර්ථක කර ගැනීම.

(ඊ) හැකිනම් දිවා ආහාර ප්‍රමාණයට අතිරේකව යමක් දීම.

(ඇෆ්) ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් සැපයීම.

(ජී) පාසලේ ජාතික හා ආගමික වැඩ කටයුතුවලට සහායදීම.

(එච්) ක්‍රීඩා, මලල ක්‍රීඩා, ක්‍රීඩා තරඟ සහ බාලදක්ෂ කණ්ඩායම් ආදිය සංවිධානය
ආධාරදීම.

(අයි) පාසල් විවිධ ප්‍රසංග, ජනගායනා සහ නැටුම් දර්ශන සංවිධානය කිරීමෙහිලා සහ

(ජේ) පාසල හා සමාජය සම්බන්ධ කරන කටයුතු දියුණු කිරීම.

3. සංගමයේ සාමාජිකත්වය.

(i) සියලුම ආදි ශිෂ්‍යයෝ සාමාජිකයන් වීමට සුදුස්සෝය.

(ii) පාසලේ දැනට සිටින ගුරු මණ්ඩලයට හා එයි කලින් සිටි ගුරුවරුන්ට ද
සංගමයේ සාමාජිකයන් විය හැකිය.

4. අරමුදල්.

(i) සාමාජික ගාස්තුවක්.

(ii) වාර්ෂික දායක මුදලක්.

(iii) වෙනත් විශේෂ කරුණක් සඳහා එකතු කරනලද දායක මුදල.

5. සංගමයේ රැස්වීම.

(i) කල් ඇතිව ලියා දැන්වීමෙන් පසු සංගමයේ මහා සභා රැස්වීම යටත් පිරිසෙයින් අවුරුද්දකට වරක් පවත්වනු ලැබේ.

(ii) එවැනි රැස්වීම සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කර තබනු ලැබේ.

(iii) යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කල්දීම, වාර්ෂික මහා සභා රැස්වීමට යටත් පිරිසෙයින් දින 7 කට කලින් සංගමයේ ලේකම්වරයා (සම ලේකම්) වෙත යැවිය යුතුය.

(iv) සංගමයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන ලෙස යටත් පිරිසෙයින් සාමාජිකයන් දස දෙනෙකු විසින් ලියවිල්ලකින් ඉල්ලුම්කර සති 3 ක් ඇතුළත ලේකම්වරයා (සම ලේකම්) විසින් එසේ රැස්වීමක් කැඳවනු ලැබේ. විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට හේතුව එම ඉල්ලීමේ සඳහන්ව තිබිය යුතුය.

6. නිලධාරි මණ්ඩලය.

(i) අනුශාසක.

(ii) සභාපති—විද්‍යාලයාධිපති/පාසල් ප්‍රධානියා (නිල බලයෙන්).

(iii) උප සභාපතිවරු—සාමාජිකයන් අතුරෙන් තෝරාගනු ලැබේ.

(iv) ලේකම්— (ඒ) ලේකම් (එක් අයෙකු)
(බී) උපලේකම් හෝ
(සී) සම ලේකම්වරු.

(v) භාණ්ඩාගාරික— (ඒ) භාණ්ඩාගාරික (එක් අයෙකු)
(බී) උප භාණ්ඩාගාරික හෝ
(සී) සම භාණ්ඩාගාරික.

(vi) කාරක සභාවක්—සාමාජිකයන්ගේ ගණන ආදී ශිෂ්‍ය සංගමයේ ප්‍රමාණය අනුව වෙනස්වේ. 5 දෙනෙකුට නො අඩු එහෙත් 12 දෙනෙකුට නො වැඩි විය යුතුය.

(vii) ගණන් පරීක්ෂකවරයෙක්—ඔහු සාමාජිකයන්ගෙන් කෙනෙකු විය හැක. නැතහොත් සංගමය මගින් පත් කරන ලද වෙනත් අයෙකු විය හැක.

ඊ. එච්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.